# ධම්මචක්ඛප්පවත්තන සූත්‍රය

මාගේ බුදුපියාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූ බරණැස ඉසිපතනේ පිහිටි මූලගන්ධකුටි විහාරයේ මහ සඟරුවන සමග එක්ව අපි දැන් ඒ උත්තම සූත්‍රය සජ්ඣායනා කරමු.

එවං මෙ සුතං එකං සමයා භගවා භාරාණසියං විහරති ඉසිපතනේ මිගදායේ, තත්‍ර බෝ භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තේසි.

දෙව මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතේන නසේවිතබ්බා, යෝ චායං කාමේසු කාම සුඛල්ලිකානු යෝගෝ හීනෝ ගම්මෝ පොථුජ්ජනිකෝ අනරියෝ අනත්ථසංහිතෝ. යෝචායං අත්තකිලමථානු යෝගෝ දුක්ඛෝ අනරියෝ අනත්තසංහිතෝ ඒතේ තේ භික්ඛවෙ උභෝ අන්තේ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා. චක්ඛුකරණී, ඤාණ කරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

කතමා ච සා මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය, නිබ්බාණාය සංවත්තති. අයමේව අරියෝ අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං? සම්මාදිට්ඨි, සම්මා සංකප්පෝ සම්මා වාචා සම්මා කම්මන්තෝ සම්මා ආජීවෝ සම්මා වායාමෝ සම්මා සති සම්මා සමාධි. අයං බෝ සා භික්ඛවේ මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය, නිබ්බාණාය සංවත්තති.

ඉදං බෝ පන භික්ඛවේ දුක්ඛං අරියසච්චං ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛෝ මරණම්පි දුක්ඛං අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ පියේහි විප්පයෝගෝ දුක්ඛෝ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සඞ්ඛිත්තේන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා.

ඉදං බෝ පන භික්ඛවේ දුක්ඛසමුදයං අරියසච්චං යායං තණ්හා පෝනෝභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභි නන්දිනී සෙය්‍යථීදං? කාමතණ්හා භවතණ්හා විභවතණ්හා.

ඉදං බෝ පන භික්ඛවේ දුක්ඛනිරෝධෝ අරියසච්චං යො තස්සායේව තණ්හාය අසේසවිරාගනිරෝධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ.

ඉදං බෝ පන භික්ඛවේ දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චං අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ සෙය්‍යථීදං සම්මා දිට්ඨි, සම්මා සඞ්කප්පෝ, සම්මා වාචා, සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ, සම්මා වායාමෝ, සම්මා සති, සම්මා සමාධි.

ඉදං දුක්ඛං අරියසච්චන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු. චක්ඛං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි තං බෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤෙය්‍යන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි තං බෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤාතන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි .

ඉදං දුක්ඛ නිරෝධං අරියසච්චන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු . චක්ඛං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි තං බෝ පනිදං දුක්ඛනිරෝධෝ අරියසච්චං සච්චිකා තබ්බන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි තං බෝ පනිදං දුක්ඛනිරෝධෝ අරියසච්චං සච්ඡිකතන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි .

ඉදං දුක්ඛනිරෝධ ගාමිණී පටිපදා අරියසච්චන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි තං බෝ පනිදං දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්චං භාවේ තබ්බන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි තං බෝ පනිදං දුක්ඛනිරෝධගාමිනී පටිපදා අරියසච්චං භාවිතන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

යාව කිවඤ්ච මේ භික්ඛවේ ඉමේසු චතුසු අරියසච්චේසු එවං තිපරි වට්ටං ද්වාදසාකරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහෝසි නේවතාවාහං භික්ඛවේ සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සාය අනුත්තරං සම්මා සම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤා සිං.

යතෝ ච බෝ මේ භික්ඛවේ ඉමේසු චතුසු අරියසච්චේසු ඒවං තිපරිවට්ටං ද්වාදසාකරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහෝසි, අථාහං භික්ඛවේ සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකෙ සස්සමණ

බ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සාය අනුත්තරං සම්මා සම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං ඤාණඤ්ච පන මේ දස්සනං උදපාදි අකුප්පා මේ චේතෝ විමුත්ති අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝති.

ඉදමවෝච භගවා අත්තමනා පඤ්චවග්ගියා භික්ඛු භගවතෝ භාසිතං අභිනන්දුන්ති.

ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤඳ මානේ ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධධම්මන්ති.

පවත්තිතේ ච පන භගවතා ධම්මචක්කේ භුම්මා දේවා සද්දමනුස්සාවේසුං ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

භුම්මානං දේවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දේවා සද්ද මනුස්සවේසුං ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

චාතුම්මහාරාජිකානං දේවානං සද්දං සුත්වා තාවතිංසා දේවා සද්දමනුස්සාවේසුං ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

තාවතිසංසානං දේවානං සද්දං සුත්වා යාමා දේවා සද්දමනුස්සාවේසුං ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

යාමානං දේවානං සද්දං සුත්වා තුසිතා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියා සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

තුසිතානං දේවානං සද්දං සුත්වා නිම්මාණරතී දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියා සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

නිම්මාණරතීනං දේවානං සද්දං සුත්වා පරනිම්මිත වසවත්තිනෝ දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියා සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

පරනිම්මිත වසවත්තීනං දේවානං සද්දං සුත්වා බ්‍රහ්ම පාරිසජ්ජා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.
බ්‍රහ්මපාරිසජ්ජානං දේවානං සද්දං සුත්වා බ්‍රහ්ම පුරෝහිතා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ත

බ්‍රහ්මපුරෝහිතානං දේවානං සද්දං සුත්වා මහා බ්‍රහ්මා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

මහා බ්‍රහ්මානං දේවානං සද්දං සුත්වා බ්‍රහ්ම පුරෝහිතා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.
අප්පමාණාභා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

අප්පමාණාභානං දේවානං සද්දං සුත්වා ආභස්සරා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

ආභස්සරානං දේවානං සද්දං සුත්වා පරිත්තසුභා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

පරිත්තසුභානං දේවානං සද්දං සුත්වා අප්පමාණසුභා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

අප්පමාණසුභානං දේවානං සද්දං සුත්වා සුභ කිණ්හකා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

සුභකිණ්හකානං දේවානං සද්දං සුත්වා වේහප්ඵලා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

වේහප්පලානං දේවානං සද්දං සුත්වා අවිහා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

අවිහානං දේවානං සද්දං සුත්වා අතප්පා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

අතප්පානං දේවානං සද්දං සුත්වා සුදස්වා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

සුදස්සසානං දේවානං සද්දං සුත්වා සුදස්සි දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

සුදස්සීනං දේවානං සද්දං සුත්වා අකණිට්ඨකා දේවා සද්දමනුස්සාවේසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායේ අනුත්තරං ධම්මචක්ඛං පවත්තිතං අප්පතිවත්තියං, සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කේනචි වා ලෝකස්මින්ති.

ඉතිහ තේන ඛණේන තේන මුහුත්තේන යාව බ්‍රහ්මලෝකා සද්දෝ අබ්භුග්ගඤ්ජි අයඤ්ච දස සහස්සි ලෝකධාතු සංඛම්පි සම්පකම්පි සම්පවේධි, අප්පමාණෝ ච උළාරෝ ඕභාසෝ ලෝකෝ පාතුරහෝසි අතික්කම්ම දේවානං දේවානුභාවන්ති.

අථ ඛෝ භගවා උදානං උදානේසි ''අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤො අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤොති''ඉතිහි දං ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤො ත්වේව නාමං අහෝසීති.

## ධම්මචක්ඛප්පවත්තන සූත්‍රය අපි අපේම බසින් වටහා ගනිමු.

මා විසින් මෙසේ අසන ලදී. /එක් සමයෙක් භාග්‍යවත් බුදුරජාණනි වහන්සේ/ බරණැස ඉසිපතන නම් මිගදායේ වැඩ වසන සේක./ එකල්හි භාග්‍යවතුන් වහන්සේ/ පස්වග භික්ෂූන් අමතා /මේ ධම්මචක්ක/ දේශනය වදාළ සේක.

පින්වත් මහණෙනි, / පැවිද්දන් විසින් සේවනය නොකළ යුතු වූ / මේ අන්ත දෙකකි./

යම් මේ කාමයන්හි කාම සුඛයේ ඇලී ගැලී වාසය කිරීමක් ඇත්ද/ මෙය හීණ වූ දෙයකි./ ලාමක වූ දෙයකි. /පුහුදුන් ජනයා විසින් සේවනය කරන දෙයකි./ උත්තම මිනිසුන් විසින් සේවනය නොකරන දෙයකි. /අනර්ථ සහිත දෙයකි.

පින්වත් මහණෙනි,/ ඒ මේ අන්ත දෙකට නොපැමිණ/ තථාගතයන් වහන්සේ විසින් /මධ්‍යම ප්‍රතිපදාව අවබෝධ කරන ලදී./මේ මධ්‍යම ප්‍රතිපදාව/ දහම් ඇස ලබාදෙයි. /නුවණ උදා කරයි./ සංසිඳීම ඇති කරයි./ විශේෂ ඤාණය ඇති කරයි./නිවන පිණිස පවතින්නේය.

පින්වත් මහණෙනි,/තථාගතයයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද/ දහම් ඇස ලබා දෙන,/ නුවණ උදාකරන,/ සංසිඳීම ඇති කරන,/ අවබෝධය ඇති කරන,/ නිවන පිණිස පවතින්නා වූ,/ මධ්‍යම ප්‍රතිපදාව නම් කුමක්ද?

ඒ මේ ආර්යඅෂ්ඨාංගික මාර්ගය මය./ එනම් සම්මා දිට්ඨිය ද,/ සම්මා සංකල්පය ද,/ සම්මා වාචා ද,/ සම්මා කම්මන්තය ද,/ සම්මා ආජීවය ද,/ සම්මා වායාමය ද,/ සම්මා සතිය ද,/ සම්මා සමාධිය ද යන මෙයයි.

පින්වත් මහණෙනි,/තථාගතයයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද/ දහම් ඇස ලබා දෙන,/ නුවණ උදාකරන,/ සංසිඳීම ඇති කරන,/ අවබෝධය ඇති කරන,/ නිවන පිණිස පවතින්නා වූ,/ මධ්‍යම ප්‍රතිපදාව නම් මෙයයි.

පින්වත් මහණෙනි,/ මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යයයි. ඉපදීමද දුකකි./ ජරාවට පත්වීම ද දුකකි./ රෝග පීඩා වැළඳීමද දුකකි./ මරණය ද දුකකි./අප්‍රිය පුද්ගලයන් හා අප්‍රිය වස්තූන් සමග එක්වීම ද දුකක./ ප්‍රිය පුද්ගලයන් හා ප්‍රිය වස්තූන්ගෙන් වෙන්වීම ද දුකකි./ කැමති වන්නා වූ යම් දෙයක් ඇත්ද/ එය නොලැබීම ද දුකකි./සංක්ෂේපයෙන් කිවතොත්/ පංච උපාදානස්කන්ධයෝම දුකකි.

පින්වත් මහණෙනි,/ මෙය වනාහී දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යයයි.
පුනර්භවය ඇති කරන,/ ආශ්වාදයෙන් ඇලෙන්නා වූ/ ඒ ඒ තැන සතුටින් පිළිගන්නා වූ/ යම් ඒ තණ්හාවක් ඇත් ද එයයි. / එනම් කාම තණ්හාව ය./ භව තණ්හාවය./ විභව තණ්හාවය.

පින්වත් මහණෙනි,/ මෙය වනාහී දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යයයි ඒ තණ්හාවේම ඉතිරි නැතිව/ නොඇල්මෙන් නිරුද්ධ වීමක් වේද,/ දුරුවීමක් වේද,/ තණ්හාවෙන් මිදීමක් වේද,/ ආලය නැතිවීමක් වේද/එයයි..

පින්වත් මහණෙනි,/ මෙය වනාහී දුක නැතිවීම පිණිස පවතින/ ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යයයි./එනම් සම්මා දිට්ඨිය ද,/ සම්මා සංකල්පය ද,/ සම්මා වාචා ද,/ සම්මා කම්මන්තය ද,/ සම්මා ආජීවය ද,/ සම්මා වායාමය ද,/ සම්මා සතිය ද,/ සම්මා සමාධිය ද යන මෙයයි.

පින්වත් මහණෙනි,/ මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යයයි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඤාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

ඒ දුක නම් වූ ආර්ය සත්‍යය/ පරිපූර්ණ වශයෙන් අවබෝධ කරන ලදී යැයි කියා/ මා මීට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඤාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

පින්වත් මහණෙනි,/ මෙය වනාහී දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යයයි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඥාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

ඒ දුක ඇතිවීම නම් වූ ආර්ය ප්‍රහාණය කළ යුතු යැයි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඥාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

ඒ දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය කළ යුතු යැයි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඥාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

ඒ දුක ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය/ ප්‍රහාණය වූයේ යැයි ක යැයි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඥාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

පින්වත් මහණෙනි,/ මෙය වනාහී දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යයයි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඥාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

ඒ දුක නැති වීම නම් වූ ආර්ය සත්‍යය/සාක්‍ෂාත් කළයුතු යැයි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඥාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

ඒ දුක නැති වීම නම් වූ ආර්ය සත්‍යය/සාක්‍ෂාත් කරන ලදී යැයි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඥාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

පින්වත් මහණෙනි,/ මෙය වනාහී දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යයයි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඥාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

ඒ දුක නැතිවීම පිණිස පවතින /ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය ප්‍රගුණ කළයුතු යි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඥාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

ඒ දුක නැතිවීම පිණිස පවතින /ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය ප්‍රගුණ කරන ලදී යි කියා/ මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි /දහම් ඇස පහළ විය./ඥාණය පහළ විය./ ප්‍රඥාව පහළ විය./ විද්‍යාව පහළ විය./ආලෝකය පහළ විය.

පින්වත් මහණෙනි,/ මේ චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳ ව/ මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතුව/ ආකාර දොළසකින් යුතුව/ සැබෑ තත්වය නම් වූ/ ඥාණ ධර්ශනය/ සුවිශුද්ධ ලෙස මා හට යම් තාක් අවබෝධ නො වූයේ වේද, / ඒ තාක් කල්ම පින්වත් මහණෙනි,/ දෙවියන් සහිත වූ ලෝකයේ/ මරුන් සහිත වූ, බඹුන් සහිත වූ/ ශ්‍රමණක් බ්‍රාහ්මණයන් සහිත වූ/ දෙව් මිනිස් ප්‍රජාව තුළ/ මම වනාහී අනුත්තර වූ සම්මා සම්බෝධිය/ අවබෝධ කළෙමි යි ප්‍රතිඥා නොදුන්නෙමි.

යම් කලෙක පින්වත් මහණෙනි, /මා හට මේ චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳ ව/ මේ ආකාරයට පරිවර්තන තුනකින් යුතුව/ ආකාර දොළසකින් යුතුව/ සැබෑ තත්වය නම් වූ ඥාණ දර්ශනය/ සුවිශුද්ධ ලෙසටම අවබෝධ වූයේ වේද, /ඒ තාක් කල් ම පින්වත් මහණෙනි,/ දෙවියන් සහිත වූ ලෝකයේ/ මරුන් සහිත වූ බඹුන් සහිත වූ/ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ/ දෙව් මිනිස් ප්‍රජාව තුළ/ මම වනාහී අනුත්තර වූ සම්මා සම්බෝධිය/ අවබෝධ කළෙමි යි ප්‍රතිඥා දුන්නෙමි.

මා හට ඥාණ දර්ශනය පහළ විය./ මාගේ චේතෝ විමුක්තිය/වෙනස් නොවන්නේය./ මෙය වනාහී අන්තිම ඉපදීම වේ./ දැන් මා හට පුනර්භවයක් නැත්තේය.

භාග්‍යවතුන් වහන්සේ/ මේ ධම්මචක්ක දේශනය වදාළ සේක./ අතිශයින් සතුටට පත් වූ/ ඒ පස්වග භික්‍ෂූන් වහන්සේලා/ භාග්‍යවතුන් වහන්සේ විසින්/ වදාරණ ලද/ මේ ශ්‍රී සද්දර්මය/ මහත් සොම්නසින් යුතුව/ පිළිගත්තාහුය.

මේ ධම්මචක්ක දේශනය වදාරණ කල්හි/ ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට/ හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගත්තා වූ/ යම් දෙයක් ඇත්ද/ හේතූන් නිරුද්ධ වීමෙන්/ ඒ සියල්ලම නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්ත යැයි කියා/ කෙලෙස් රහිත වූ/ අවද්‍යා මලකඩ රහිත වූ/ දහම් ඇස පහළ විය.

අපගේ භාග්‍යවතුන් වහන්සේ විසින්/ බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ/ ධම්මචක්කය පවත්වන ලදී./ එය වනාහී ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ/ දෙවියෙකුට හෝ/ මාරයෙකුට හෝ/ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ/ වෙනස් කළ නොහැක්කේම යයි කියා/ පොළොව වාසී දෙවියෝ/ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

පොළොව වාසී දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ චාතුම්මහාරාජික දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

චාතුම්මහාරාජික දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ තාවතිංස දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

තාවතිංස දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ යාම දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

යාම දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/තුසිත දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

තුසිත දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ නිම්මාණරතී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

නිම්මාණරතී දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ පරනිම්මිතවසවත්ති දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

පරනිම්මිත වසවත්ති දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ බ්‍රහ්මපාරිසජ්ජ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

බ්‍රහ්මපරිසජ්ජ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ බ්‍රහ්ම පුරෝහිත දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

බ්‍රහ්ම පුරෝහිත දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ බ්‍රහ්ම දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

මහා බ්‍රහ්ම දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ පරිත්තාභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

පරිත්තාභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ අප්පමාණබ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

අප්පමාණභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ ආභස්සර දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

ආභස්සර දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ පරිත්ත සුභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

පරිත්තසුභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ අප්පමාණ සුභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

අප්පමාණසුභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ සුභකිණ්හ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

සුභකිණ්හ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ වේහප්ඵල දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

වේහප්ඵල දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ අවිහ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

අවිහ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ අතප්ප දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

අතප්ප දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ සුදස්ස දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

සුදස්ස දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ සුදස්ස දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

සුදස්ස දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා/ සුදස්සි දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

සුදස්සි දෙවියන්ගේ දහම් ඝෝෂා/ අපගේ බාග්‍යවතුන් වහන්සේ විසින්/ බරණැස ඉසිපතන මිගදායෙහි/ අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදී./ එය වනාහී ශ්‍රමණයෙකුට හෝ/ බ්‍රාහ්මණයෙකුට හෝ/ දෙවියෙකුට හෝ / මාරයෙකුට හෝ/ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ / වෙනස් කළ නොහැක්කේම යි කියා/ අකනිට්ඨ දෙවියෝද දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

ඒ ක්ෂණයෙහිම, ඒ මොහොතෙහිම, බ්‍රහ්ම ලෝක යම් තාක් වේද/ ඒ තාක්ම මේ දහම් ඝෝෂාව පැතිර ගියේය./ දස දහසක් ලෝක ධාතුවම කම්පා විය./ තදින්ම කම්පා විය./ බලවත්ව කම්පා විය.

දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා ගිය/ අප්‍රමාණ වූ ආලෝකයක් /ලොකයෙහි පැතිර ගියේය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ උදානයක් පහළ කළ සේක.

භවත් කොණ්ඩඤ්ඤ තෙමේ/ ඒකාන්තයෙන්ම අවබෝධ කළා/භවත් කොණ්ඩඤ්ඤ තෙමේ/ ඒකාන්තයෙන්ම අවබෝධ කළා/

මේ ආකාරයෙන්/ ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට/ අඤ්ඤා කොණ්ඩඤ්ඤ යන නාමය ඇතිවූයේය.

*"ඒතේන සච්චේන සුවත්ථි හෝතු"*
**මේ සත්‍යානුභාවයෙන් සැමට සෙත් වේවා!**